**ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය -2022**
-----------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ පිරියත හා උපකරණ**

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත පවරන ලද රු.16,000,000 ක් වූ වාහනයක් හා 2020 වර්ෂයේ අපහරණය කරන ලද රු.21,250,000 ක වාහන 05ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර රු.4,200,000 ක් වූ වාහනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දෙවරක් සටහන් කර තිබුණි. | පවරන ලද, අපහරණය කරන ලද හා දෙවරක් සටහන් වී ඇති වාහනවල වටිනාකම් ඉවත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාහන වටිනාකම නිවැරදිව සටහන් කළ යුතු වීම. |
| (ii) | වාහන 10ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණු අතර, වාහන අංකයක් නොමැතිව වෑන් එකක් සඳහා රු.252,730 ක් ඇතුළත් කර තිබුණි. | වාහනවල වටිනාකම් ප්‍රත්‍යාගණනය කර සිගැස් වාහන ලැයිස්තුවට ඇතුළත් කිරීමට සහ රු.252,730ක වටිනාකම සිගැස් වාහන ලැයිස්තුවෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාහන වටිනාකම නිවැරදිව සටහන් කළ යුතු වීම. |

**(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ විදේශ දූත මණ්ඩල 66ක රු.12,302,725,029ක පුනරාවර්තන වියදම් හා රු.39,229,873ක මූලධන වියදම් සඳහා වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | දූත මණ්ඩලවලට අදාළ ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | සියලුම ගෙවීම් වවුචර් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | එකතුව රු.3,736,755ක් සඳහා ආරක්ෂිත තැන්පතු/තත්කාර්ය අතුරු අග්‍රිම කපා හැරීම/ පියවීම සඳහා අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙහි සඳහන් ලේඛන මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇති බව. | ලේඛන විගණනයට ඉදිරිපත් කල බව ප්‍රකාශ කරනු ලැබුවද, ලේඛන ඉදිරිපත් කර නොමැති බැවින් අදාල ලේඛන ඉදිරිපත් කල යුතු වීම. |
| (iii) | භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.11,508,887,742ක් සඳහා හා රු.7,264,782,498ක වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් සඳහා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙහි සඳහන් ලේඛන මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇති බව. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **7002-0-0-35-13 දරන අග්‍රිම ගිණුම** | | |
| (i) | අග්‍රිම ගිණුමේ ශේෂය 2013 හා ඊට පෙර වර්ෂවලට අදාළ නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ රු.89,919,237ක් වූ අග්‍රිම ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.3,958,719 ක් එනම් සියයට 4.4 ක් වැනි සුළු ප්‍රතිශතයක් පමණක් නිරවුල් කර තිබුණි. | අග්‍රිම ගිණුම් වලට අදාළ සියලු ශේෂයන් පිළිබඳ තොරතුරු සොයා බලා කඩිනම් පියවර ගැනීම සඳහා කමිටුවක් පත්කර විමර්ශන කටයුතු සිදුකරමින් පවතින බව. | නොපියවූ අත්තිකාරම් කඩිනමින් අය කර නිරවුල් කළ යුතු වීම. |
| (ii) | විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්ය මණ්ඩලයට ලබාදෙන ලද නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වලින් රු.55,619,842ක් වූ තැන්පතු 242ක් භාවිතා නොකරන නිවාසවලට අදාළ වී තිබුණි. ඉන් රු.12,296,875ක් වර්ෂ 20 ඉක්මවා තිබූ අතර, රු.39,482,801ක් වර්ෂ 10ක සිට වර්ෂ 20ක් දක්වා අතර පරාසයක් හා රු.3,840,166ක් වූ ඉතිරිය වර්ෂ 09ක් ඉක්මවා තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ | පවතින තොරතුරු සමාලෝචනය කර ශේෂ නිරවුල් කිරීම සිදු කරමින් පවතී. එසේම මෑත කාලීනව තැබූ ආරක්ෂිත ඇප තැන්පතු බොහෝමයක් අභ්‍යන්තර චක්‍රලේඛ අනුව අයකර ගැනීමට කටයුතු කර ඇත. | භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු අයකර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු වීම හා නොපියවූ අත්තිකාරම් කඩිනමින් නිරවුල් කළ යුතු වීම . |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල් විසින් 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 250 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (iii) | කාර්ය නිමවූ විගස තත්ත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් නොපියවූ අග්‍රිම ශේෂය තුළ රු.29,861,398ක් තත්ත්කාර්ය අතුරු අග්‍රිම 127ක් පැවතිණි. ඉන් රු.699,358ක් වර්ෂ 20ක් ඉක්මවා තිබූ අතර රු.12,834,946ක් වර්ෂ 10ක සිට වර්ෂ 20ක් දක්වා අතර පරාසයක හා රු.16,327,094ක් වූ ඉතිරිය වර්ෂ 08 ක් ඉක්මවා තිබුණි. | මෙහි සඳහන් අයිතම 03කට අදාළ රු.3,736,756.00ක වටිනාකම ගිණුම්ගත කිරීම් දෝෂයන් මත පැනනැගී ඇති බව හඳුනාගත් අතර, අදාළ දූත මණ්ඩල කාර්යාලය මඟින් ගිණුම්ගත කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නොපියවූ අත්තිකාරම් නිරවුල් කිරීමට හා අවශ්‍ය නිවැරදි කිරීම් නොපමාව සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ආ) 7002-0-0-35-22 අග්‍රිම ගිණුම**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම අග්‍රිම ගිණුම් ශේෂය තුළ නොපියවූ අත්තිකාරම් රු.364,525,410ක් විය. විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතුවලින් රු.62,637,985ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 108ක් විය. ඉන් රු.2,237,738ක් වර්ෂ 20ක් හා රු.14,338,555ක් වර්ෂ 10ක් ඉක්මවා තිබුණි. තවද, රු.22,712,529ක් වූ අත්තිකාරම් වර්ෂ 05ක සිට වර්ෂ 10ක් දක්වා අතර පරාසයක විය. | නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු නිරවුල් කිරීම සඳහා දැනටමත් තොරතුරු සොයාගෙන ඇති අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව. | විදේශ දූත මණ්ඩල නිලධාරීන්ගේ සේවය අවසන් වන අවස්ථාවේදී නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු අය කර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු වීම හා නොපියවූ අත්තිකාරම් කඩිනමින් නිරවුල් කළ යුතු වීම . |
| (ii) | වසා දමන ලද දූත මණ්ඩල 04කට අදාළ දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබන ලද නිරවුල් නොකරන ලද තැන්පතු මුදල රු.19,573,769ක් වී තිබුණි. | නීතිමය හා පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ලැබෙන තොරතුරු මත ශේෂ නිරවුල් කිරීම අඛණ්ඩව සිදු කරනු ලබන බව. | කඩිනමින් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම . |

| | | | |
|---|---|---|---|
| (iii) | නොපියවූ අත්තිකාරම් තුළ රු.17,486,532ක් තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර එයින් වර්ෂ 20 ඉක්මවූ රු.2,526,120ක් ද වර්ෂ 10 ඉක්මවූ රු.2,227,286ක් හා වර්ෂ 05 ඉක්මවූ රු.5,458,192ක් ද විය. | තත්කාර්යය අතුරු අග්‍රිම පියවීම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම හා නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නොපියවූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371 අනුව අතුරු අග්‍රිමයක් දෙන කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවත් අලාභහානි යටතේ දක්වා තිබූ විදේශ දූත මණ්ඩල 02කට අදාළව දෙන ලද එකතුව රු.548,054ක නොපියවූ අත්තිකාරම් සඳහා වර්ෂ 09 ක සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. | නැවත සමාලෝචනය කර ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, කමිටුවේ නිර්දේශ මත නිරවුල් කිරීමට කටයුතු යොදා ඇති බව. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නොපියවූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.2. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති රෙගුලාසි හෝ විධිවිධානවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | 699,419 | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් යනතුරුත් හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් එකතුව රු.699,419 ක් වූ තැන්පතු 06ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 142 ඡේදය | 12,917,591 | රජයේ නිලධරයෙකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදාහැරීම අදාළ පත්කිරීම් බලධරයාගේ අනුමැතිය මත සිදුකල යුතු වුවත් අමාත්‍යාංශය මඟින් ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර | ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය සඳහා ඉදිරියේදී විධිමත් කාර්ය | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය වෙත එසේ විධිමත්ව මුදාහැරීමක් සිදුනොකර නිලධාරීන් අනුයුක්ත කිරීමක් සිදුකර ඔවුන්ගේ වැටුප් ලෙස රු.12,917,591ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | මණ්ඩලයක් අනුමත කර ගැනීමට කටයුතු සම්පාදනය කෙරෙමින් පවතින බැවින් එම කටයුතු අවසන් වූ වහාම විධිමත් පරිදි නිලධාරීන් පත් කිරීමට කටයුතු කරනු ලබන බව. | |
| (iii) | 2016 ජනවාරි 08 දිනැති අංක 01/ 2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා 2019 ජුලි 22 දිනැති අංක 01/ 2016 (i) දරන චක්‍රලේඛය | 3,796,550 | රජයට අවශ්‍ය හදිසි සේවා සැපයීම සඳහා 2021 අගෝස්තු 01 දින සිට බලාත්මක වන පරිදි උපාය මාර්ගික සන්නිවේදන ඒකකයක් නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුක්තව පිහිටුවා තිබුණි. චක්‍රලේඛ උපදෙස්වලට අනුව මෙවැනි කාර්යයන් සඳහා ගෙවීම් දින 90ක් නොඉක්මවන කොන්ත්‍රාත් සඳහා පමණක් සීමා විය යුතු නමුත් වර්ෂයක කාලයක් සඳහා මෙම නිලධාරීන් බඳවාගෙන තිබුණි. චක්‍රලේඛ උපදෙස් පරිදි සම්පූර්ණ කොන්ත්‍රාත් කාර්යයක් සඳහා ලබාදිය හැකි උපරිම දීමනාව රු.150,000ක් වුවද, සම්පූර්ණ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.3,796,550 ක් වැයකර තිබුණි. | මෙම වෘත්තිකයන්ට ගෙවන ලද දීමනා ඔවුන්ගේ සුදුසුකම් සමග සැසඳීමේදී ප්‍රමාණවත් නොවන බැවින් වැටුප මත සේවය කිරීමට ඔවුන් එකඟ වී ඇත. මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්ගේ මගපෙන්වීම හා සහාය අපේක්ෂා කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | 2015 ජූලි 23 දිනැති අංක 07/ 2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 08 vii ඡේදය | 716,784 | එක් එක් මාසයේ දායක මුදල ඊළග මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබීමට සැලැස්විය යුතු වුවත්, 2022 ජුනි 30 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත්කර තිබූ රු.716,784ක දායක මුදල් එසේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යවා නොතිබුණි. | නියමිත දිනට සේවක අර්ථසාධක අරමුදල වෙත මාසික දායක මුදල් යැවීමට අපහසුවක් තිබූ අතර, එම හිඟ මුදල් යැවීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ, අමාත්‍යාංශයේ හා පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ රු.6,509,030ක් වූ චෙක්පත් 120ක් හා විදේශ දූත මණ්ඩලයක ඇ.ඩො. 2500ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) පරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට නොවැම්බර් දක්වා කාලය තුළ අමාත්‍යාංශයේ රු.1,003,884ක් වූ චෙක්පත් 14ක් හා 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ කැන්බරා හා බර්ලින් දූත මණ්ඩලවල තැන්පත් කළ චෙක්පත් 05ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උපලබ්ධි වී නොතිබුණි. | තොරතුරු හඳුනාගෙන නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2021 වර්ෂයේ සැප්තැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලය තුළ හඳුනා නොගත් හර ලෙස අමාත්‍යාංශයේ රු.3,185,169ක් හා විදේශ දූත මණ්ඩල දෙකක 2000 වර්ෂයේ සිට 2021ක වර්ෂය දක්වා කාල පරාසයක හඳුනා නොගත් හර ලෙස චෙක්පත් 12 ක් පැවතුණි. | අමාත්‍යාංශයේ හඳුනානොගත් හර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව හා තානාපති කාර්යාල චෙක්පත් සම්බන්ධයෙන් හඳුනාගෙන ගිණුම්ගත කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | හඳුනා නොගත් හර කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) 2021 වර්ෂයේ දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා කාලය තුළ බැංකු ගිණුමට සෘජුව කරන ලද ලැබීම් රු.5,620,093ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් බැර හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | හඳුනා නොගත් බැර කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) ලොස් ඇන්ජලීස් දූත මණ්ඩලයෙහි 2011 වර්ෂයේදී සොරකම් කරන ලද ඇ.ඩො.1583ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල සොරාගත් පුද්ගලයාගෙන් අයකර ගැනීමට නොහැකි වී ඇති බැවින් අලාභ කපා හැරීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙස දූත මණ්ඩලය දැනුවත් කර ඇත. | සොරකම් කළ මුදල් නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ඊ) මුදල් රෙගුලාසි 395 (ආ) අනුව දූත මණ්ඩල 05ක ගිණුම් 07ක් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ ලද පසු විගණනයට ඉදිරිපත් කරනු ලබන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ඇති කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 17ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි. | මිලදී ගෙන ඇති නිවාස 17 සඳහා ඔප්පු ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර අදාළ කටයුතු අවසන් අදියරේ පවතින බව. | දේපළවල හිමිකාරීත්වය අමාත්‍යාංශය වෙත පවරා ගැනීම කළ යුතු වීම. |

**3.2 පාඩු හා හානි**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලවලට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු වලින් රු.19,640,441ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර ඉන් රු.16,141,919ක අලාභ හානි සම්බන්ධයෙන් ගත් නෛතික ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි. වර්ෂ 05ක සිට වර්ෂ 10ක් දක්වා අතර කාල පරාසයක පවතින නොවිසඳී ඇති අලාභ හානිවල වටිනාකම රු.1,275,303ක් විය. | පාඩු හා හානි ලෙස වාර්තා කර ඇති මෙම වටිනාකම් නැවත සමාලෝචනය කර ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටුවේ නිර්දේශ මත නිරවුල් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරනු ලබන බව. | අලාභ හානි කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | එකතුව රු.2,469,849ක නිවාස ආරක්ෂිත තැන්පතු 12ක් නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා වර්ෂ 08 ක සිට 20 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. | කඩිනමින් නිරවුල් කිරීම සඳහා කටයුතු යොදා ඇත. | නිවාස ආරක්ෂිත තැන්පතු කාලීනව නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2014 හා 2015 වර්ෂවලදී පිටෝරියා විදේශ දූත මණ්ඩලයේ සිදු වූ එකතුව රු.606,827ක වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් හා විදේශ දූත මණ්ඩල 03ක සිද්ධීන් 04කට අදාළව රු.259,800ක නැතිවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(i) අනුව කටයුතු කර නොතිබුණි. | රු.606,827ක හානි කපාහැරීම සම්බන්ධයෙන් කමිටු නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇති අතර රු.259,800ක අලාභහානි කපාහැරීමට අනුමැතියට ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | මුදල් රෙගුලාසි 106 අනුව ඌනතාවයක්, අයථා පරිහරණයක් හෝ වෙනත් කරුණක් නිසා මුදල්, මුද්දර, ටිකට්පත් ආදිය නැතිවූ විටක ඒ නැති වූ මුදල වහාම පූර්ණය කල යුතු වුවත් ලන්ඩන් විදේශ දූත මණ්ඩලයේ රු.1,014,295ක මුදල් සොරකම් කිරීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අලාභ හානි කපාහැරීමේ කමිටුව විසින් නැවත සමාලෝචනය කර අලාභයන් කපාහැරීමට අනුමැතියට ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ මුදල පූර්ණය කළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ දූත මණ්ඩල පවතින ස්වීඩනය හා කෙන්යාව යන රටවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා නඩත්තු නොකිරීම හේතුවෙන් නිල නිවාස කුලී වශයෙන් රු.55,583,113ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලබන බව. | වත්කම් ඵලදායීව කළමනාකරණය කළ යුතු වීම. |
| (ආ) | විදේශ තානාපති කාර්යාල සඳහා කාර්ය මණ්ඩල පත් කිරීමේදී එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා විධිමත් නිර්ණායක විශ්ලේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 අගෝස්තු මස 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග අංක 07 මඟින් නියම කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වානිජ දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අමාත්‍යාංශය මගින් සේවයේ නියුක්ත කර ඇති නිලධාරීන් සඳහා වන නිර්ණායක කැඳවීම් කර ඇති අතර මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා වන නිර්ණායක සකස් කරමින් පවතින බව. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ලබාගත් ණය සම්පූර්ණයෙන් අයකර ගැනීමට පෙර නිලධාරියෙකු මියගිය හොත් හෝ විශ්‍රාම ගිය හොත් ඔහුගෙන් රජයට අයවිය යුතු සියලුම මුදල් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 04 වගන්තිය ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් වර්ෂ 05ක වැඩි කාලයක සිට පවතින රු.273,560ක් ඇතුළුව මියගිය නිලධාරින් 07 දෙනෙකුගෙන් රු.472,532ක ණය ශේෂයක් හා විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.962,265ක ණය ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සේවය හැර ගොස් ඇති නිලධාරීන් 15 දෙනෙකුගෙන් රු.1,317,101ක ණය ශේෂයක් අයවිය යුතුව පවතින අතර එම ණය ශේෂය තුළ වර්ෂ 05ට වැඩි ශේෂය රු.662,946ක් විය. | නිලධාරීන් 11 දෙනෙකුගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර අනෙකුත් නිලධාරීන්ගේ ණය අයකර ගැනීම් පිළිබඳ තොරතුරු පසුව ඉදිරිපත් කරන බව. | සේවය හැර ගොස් ඇති නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | සේවය අවසන් කළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු.347,495ක ණය ශේෂයක් අයවිය යුතුව පවතින අතර ඒ තුළ වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු.299,955ක් විය. | සේවය අවසන් කළ නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කරගැනීම සඳහා 01/2020 චක්‍රලේඛය අනුව කටයුතු කරන බව. | සේවය අවසන් කළ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරින් 14 දෙනෙකුගේ රු.1,499,176ක හඳුනාගත නොහැකි ණය ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | හඳුනා නොගත් හිඟ ණය ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (උ) | සෞදි අරාබියේ රැකියාවක් සඳහා පිටත්ව ගොස් තිබුණු පුද්ගලයෙකු 2012 ඔක්තෝබර් 24 දින අනතුරකට භාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වී තිබුණි. එම අනතුර සිදු වී වර්ෂ 10 ක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිඳු වන්දි මුදලක් ලැබී නොතිබුණි. මෙම ගොනුව වර්ෂ 03කට ආසන්න කාලයක් එම රටෙහි රථවාහන දෙපාර්තමේන්තුව තුළ අස්ථානගත වීම සම්බන්ධයෙන් සොයා නොබැලීම, නියමිත නඩුවාර සඳහා තානාපති කාර්යාලය අධිකරණයට ඉදිරිපත් නොවීම සහ 2019 වර්ෂයේදී පෞද්ගලික නීති සේවා සපයන ආයතනයකට නඩුව භාරදීමට කටයුතු කරන බව සඳහන් වුවද 2022 වර්ෂය දක්වා එම කාර්යන් ඉටු නොවීම යනාදී කරුණු මෙම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | විදේශයන්හි සේවය සඳහා ගොස් අනතුරට පත්වූ හෝ මරණයට පත්වූ පුද්ගලයින්ගේ වන්දි ඉල්ලීම් සිද්ධි පිළිබඳ අධ්‍යානය කර අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා අතිරේක ලේකම් (ප්‍රදූත) ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පිහිටුවා ඇති අතර වන්දි සිද්ධීන්වලට අදාළ ලිපිගොනු මුල සිට අධ්‍යානය කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කෙරෙමින් පවතින බව. | තානාපති කාර්යාලයේ නිලධාරීන්ගේ වගකීම කාර්යක්ෂමව ඉටු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඐ) | කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් සඳහා 2009 දෙසැම්බර් 19 දින විදේශ ගත වූ තැනැත්තියක් 2012 ජනවාරි 29 දින මියගොස් තිබූ අතර ශ්‍රී ලංකාවට රැගෙන ආ මෘත දේහය සම්බන්ධයෙන් සිදුකරන ලද හදිසි මරණ පරීක්ෂණය අනුව මියගිය තැනැත්තියගේ අවයව ඉවත් කර ඇති බවත් ශරීරයේ සීරීම් ලකුණු විශාල ප්‍රමාණයක් ඇති බවත් සඳහන් කර තිබුණි. මරණය සිදු වී වර්ෂ 10ක් ගත වුවද, මෙම මරණයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාගැනීමට තානාපති කාර්යාලය අසමත් වී තිබූ අතර මෙම තැනැත්තිය වෙනුවෙන් කිසියම් වන්දි මුදලක් ලබාගැනීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමේදී තානාපති කාර්යාලයේ නිලධාරීන් කාර්යක්ෂමව කටයුතු සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (එ) | වර්ෂ 17ක පමණ කාලයක් කුවෙට් රාජ්‍යයෙහි ගෘහ සේවයේ යෙදී සිටි තැනැත්තියක් 2011 ඔක්තෝබර් 17 වන දින සුරක්ෂාගාරය තුළ මරණයට පත්ව තිබුණි. මියගිය අය ජීවතුන් අතර සිටියදී හාම්පුතා විසින් වකුගඩුවක් ඉවත් කරගත් බවට චෝදනා ඇති බැවින් ඒ සඳහා අදාළ විමර්ශනයන් සිදුකර වාර්තාවක් ලබාගැනීමත් මරණ පරීක්ෂණ වාර්තාවක් සහ අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාගැනීමටත් කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් (කන්සියුලර්) විසින් නියමකර තිබුණද මරණය සිදු වී වර්ෂ 11 ක් ගත වුවද එම වාර්තා ලබාගැනීමට තානාපති කාර්යාලය අසමත් වී තිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (ඒ) පෙදාහිදී 2011 වර්ෂයේදී මරණයට පත්වූ පුද්ගලයෙකුගේ මරණයට හේතුව සියදිවි නසාගැනීමක්ද නැතහොත් අනතුරකින් සිදු වූවක්ද යන්න සනාථ කරගැනීම සඳහා පොලිස් වාර්ථා ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නොහැකි වී තිබුණ අතර රක්ෂණාවරණ ලබාගැනීම සහ වන්දි මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් තානාපති කාර්යාලය කාර්යක්ෂමව කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඔ) රියාද් විදේශ දූත මණ්ඩලයෙහි 2012 වර්ෂයේ වන්දි ඉල්ලීම් ලිපිගොනු 2018 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොමැති බවත් සමාලෝචිත වර්ෂය වන විට වසර 10ක් ගතවුවද වන්දි හිමිකම් පවතීද යන්න සනාථ කර ගැනීම සම්බන්ධයෙන් නිලධාරින් වගකිවයුතු අන්දමින් කටයුතු කර නොතිබූ බව කරන ලද නියැදි සමීක්ෂණයේදී නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඕ) විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් වන අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e - DAS) රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණ ද එම කටයුතු අවසන් කර නොතිබුණි. | පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා නීති අංශයේ සහාය ඇතිව ගිවිසුමක් සකස් කර ඇති අතර ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කිරීම සඳහා විභාග සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කරමින් පවතින බව. | සැලසුම් කරනු ලබන ක්‍රියාකාරකම් කාලීනව ඉටුකළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 611ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 620ක් වූ අතර පුරප්පාඩු තනතුරු 21ක් හා අතිරික්ත තනතුරු | ඉදිරිපත් කර ඇති කාර්යමණ්ඩල තොරතුරු සමග එකඟවන බව. | අවශ්‍යතාව මත අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 30ක් විය. දූත මණ්ඩල අනුමත කාර්ය මණ්ඩලය 528ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 370ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 158ක් හා තවද දූත මණ්ඩලවල ස්ථානීය නොවන කාර්ය මණ්ඩලය 582ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 403ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 179ක් විය. | | |
| (ආ) | අමාත්‍යාංශයේ ද්වීතියික මට්ටමට අයත් අනුමත සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පිළිවෙලින් 74ක් හා 169ක් වුවද තථ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 100ක් හා 194ක් වූයෙන් අතිරික්තය 26ක් හා 25ක් විය. | විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර කළමනාකරණ සේවා නිලධාරීන් පැමිණීම හේතුවෙන් අතිරික්තයක් පැවති අතර 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් මගින් අතිරික්ත කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. 2020 සහ 2022 වර්ෂයේ රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ උපාධිධාරී අභ්‍යාසලාභීන් වශයෙන් පත්වීම් ලද හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 20ක් සිටින බව. | අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගැනීම හා අනුමත සේවක සංඛ්‍යාවට පරිබාහිරව බඳවා ගැනීම සිදු නොකළ යුතු වීම. |
| (ඇ) | අනුමත අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සංඛ්‍යාව 09ක් වුවද විධිමත් අනුමැතියකින් තොරව වැඩ බැලීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරු 10 දෙනෙක් ඇතුළුව තථ්‍ය ප්‍රමාණය 19ක් විය. | අනුමත කාර්ය මණ්ඩලය තුළ අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 09ක් ඇති අතර වැඩිවන වැඩ ප්‍රමාණයට එම ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරුන් පත්කිරීමට අමාත්‍යාංශය කටයුතු කර ඇති අතර<br>තනතුරු ප්‍රමාණය වැඩිකර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර ඇති බව. | අනුමත තනතුරු සඳහා පමණක් වැඩ බැලීම සඳහා පත්කිරීම් කළ යුතු වීම. |